# ගැනුම් කළමනාකරුවන්ගේ අප්‍රේල් නිෂ්පාදන දර්ශකය පහළට

## ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව කියයි

**බද්දේගම - ජී. කමලනාථ්**

2019 මාර්තු මාසයේ 66.9ක් ලෙස සටහන් වූ නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය අප්‍රේල් මාසයේදී 41 දක්වා දර්ශකාංක 25.9කින් පහළ ගොස් ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව නිකුත් කළ නිවේදනයක දැක්වේ. මෙය ඉතිහාසයේ වාර්තා වූ පහළම අගය බවද එම නිවේදනයේ දැක්වේ.

එම නිවේදනයෙන් පෙන්වා දෙන පරිදි ආහාර, පාන වර්ග, රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයන්හි නව ඇණවුම් සහ නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සිදුවූ සැලකිය යුතු අඩුවීම නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පහළ යෑමට හේතු වී තිබේ. අප්‍රේල් මාසයේ අලුත් අවුරුදු නිවාඩුවට සහ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් රටේ ආරක්ෂක වැඩපිළිවෙළ කර්මාන්තශාලාවල සුමට ක්‍රියාකාරීත්වයට සිදුකළ අහිතකර බලපෑම් හේතුවෙන් කර්මාන්තශාලාවල රාජකාරි වේලාවන් සීමා කිරීමට වීම හේතුවෙන් අපේක්ෂිත නිෂ්පාදන මට්ටම් ළඟා කර ගැනීමට නොහැකි වීම ඇතුළු කරුණු නිසා මේ තත්ත්වය ඇති වී තිබේ.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ උප අයිතමයන් වන නව ඇණවුම් 75.8ක්, නිෂ්පාදන 74.2, සේවා නියුක්ති 57.1ක් ගැනුම් තොගය 64.6ක්, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය 51.5ක් ලෙස 2019 මාර්තු මාසයේදී සටහන් විය. එහෙත් අප්‍රේල් මාසයේදී නව ඇණවුම් 37.5ක්, නිෂ්පාදන 32.5ක්, සේවා නියුක්තිය 43.5ක්, ගැනුම් තොගය 41.0 ලෙස සියලු අංශවල දර්ශක අගයන් කැපී පෙනෙන ලෙස පහත වැටිණි.

එමෙන්ම 2019 මාර්තු මාසයේ 56.3ක් වූ සේවා අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය අගය අප්‍රේල් මාසයේදී 45.3ක් දක්වා දර්ශකාංක 11කින් පහත වැටිණි.

සංචාරක පැමිණීම අඩුවීම, දෛනික ක්‍රියාකාරකම් මත රඳාපවතින තොග සහ සිල්ලර වෙළෙඳාම්, ප්‍රවාහන, ආහාර පාන, නවාතැන් පහසුකම් සැපයීම ඇතුළු සේවා අංශවල පහළ යෑම මෙයට හේතුවී ඇතැයිද මහ බැංකු නිවේදනයේ දැක්වේ.